මාධ්‍ය සඳහා තමන් භාවිතා කරනා භාෂාව සම්බන්ධයෙන් නිර්මාණශීලී වීමේ අයිතිය තිබේ. එසේ වුවත්, එම නිර්මාණශීලීත්වයේ සීමාව විය යුත්තේ ශිෂ්ට සම්පන්න භාෂාවකි. මන්දයත්, සමාජයක ශිෂ්ට සම්පන්න චින්තනයක් හැඩගැස්වීමෙහි ලා මාධ්‍ය අතද වගකීමක් ඇති බැවිනි.

එසේ ගත් විට "ජාවාරමා/ජාවාරමුන්" වැනි යෙදුම් මාධ්‍ය තුළ යොදාගැනීම කෙතරම් දුරට යෝග්‍ය වේ ගැටළුවකි. මෙහිදී අප අවධානය යොමු කරන්නේ ශිෂ්ට සම්පන්නදැයි විවාදාපන්න යෙදුම් ඔස්සේ සමස්තයක් ලෙසින් සමාජයට වන බලපෑම පිළිබඳවයි. එසේ ගත් විට මාධ්‍ය මෙවැනි යෙදුම් භාවිතයෙන් වැළකීම වඩාත් යෝග්‍ය යැයි ඔබ නොසිතන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Lankadeepa